# ඓතිහාසික රඹකැන්ඔය ජලාශයේ ඉපැරණි සොරොව් ඇළේ තාක්ෂණය

**ඩී.එම් චරිත බුද්ධික විජේරත්න**[1]

අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොල්ලේබැද්ද ග්‍රාම නිළධාරී වසම තුළ ඉදිකර ඇති රඹකැන්ඔය ජලාශය වන නූතන ඉදිකිරීම සඳහා පාදක කරගත් ඓතිහාසික ජලාශයේ නටඹුන් අදට ද දක්නට ඇත. මේ තුළ දැකගත හැකි සුවිශේෂී ශෛලමය ඉදිකිරීමක් වන ඓතිහාසික ඇළ මාර්ගය දකින්නන්ගේ සිත් විශ්මයට පත්කරන්නා වූ නිර්මාණයකි. ඒ මෙම ඉදිකිරීමට යොදාගෙන ඇති දැවැන්ත ග්‍රැනයිට් කුට්ටි නිසාය. මේවා කවදා කෙසේ මෙම ස්ථානයට ගෙනාවේද? කවුරුන් විසින් මෙම ඉදිකිරීම සිදුකරේ ද? යන්න ප්‍රශ්න කිහිපයක්ම මෙම නිර්මාණය දුටු විගස මතුවෙයි. ඉදිකිරීම සිදුකරනු ලබූ කාලය පිළිබඳව නිශ්චිතව තවමත් තහවුරු කරගෙන නොමැති අතර මෙය පැරණි ජලාශයේ සොරොව්ව සඳහා නිර්මාණය කලාහැයි තහවුරු කිරීමට මෙයට යාබඳව පිහිටා ඇති පැරණි බැම්මේ මිණුම් අනුව පෙන්වාදිය හැකිය. මෙම ඉදිකිරීම ලංකාවේ වාරි තාක්ෂණයේ විශ්මිත නිර්මාණයක් වන්නේ දැනට ලංකාවේ සොයාගෙන ඇති ඉපැරණි ඇළමාර්ග අතරින් ගල්වලින් නිර්මාණය කරන ලද දිගම හා විශාලතම සොරොව් ඇළ වීම නිසාය. දිගින් මීටර් 115 යුත් ඇළ එකම පාදමක් මත මාර්ග දෙකකට බෙදා නිර්මාණය කර ඇත. මෙම ඉදිකිරීම් තාක්ෂණය අතීත ශිලා තාක්ෂණයේ භාවිතාව හා දියුණුව කියාපායි. මෙයට යාබඳව ඉදිකර ඇති බැම්මේ ප්‍රමාණය යා එහි සමස්ථ මිණුම්වලට අනුව මෙම ඇළ බැම්මට සම්බන්ධ කිරීමට ඉදිකරන්නට ඇතැයි පවතින මතයකි. ඇළ මාර්ගය කොටස් දෙකකට බෙදා වෙන්කර ඇත්තේ ගල් වැද්දුම් ක්‍රම කිහිපයක්ම උපයෝගි කරගනිමිනි. අතීත වාරි ඉංජිනේරුවාගේ මිණුම් ක්‍රම කොතෙක් තාක්ෂණික මට්ටමක පවතින්නට ඇතැයි යන්න ජලයේ පීඩනය, ඇළ මාර්ගයේ කල්පැවැත්ම හා අවශ්‍ය ජල පරිමාණය මුදාහැරීම යන මූලික කාරණා සැලකිල්ලට ගනිමින් ඉදිකර තිබීම තුළින් තහවුරු වෙයි. විශේෂයෙන්ම භූමියේ ඇති ජල බැස්ම හා ජලය බෙදාහැරීමේ දිශාව පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වන්නට ඇතැයි නූතන ජලාශය ඉදිකිරීමේදී ලබාගෙන ඇති මිනුම් මේ හා සමපාත වීමෙන් තහවුරු වෙයි. ග්‍රැනයිට් කුට්ටි අතරින් මුදාහරින ජලයේ පීඩනය ඇළ මාර්ගයට හානියක් නොවන ආකාරයකට ඔරොත්තුදීම සඳහා සුවිශේෂී තාක්ෂණික භාවිතාවන් කිහිපයක්ම උපයෝගී කරගන්න්ට ඇතැයි යන්න මෙහි දක්නට ඇති නෂ්ඨාවශේෂ තුළින් තහවුරු කරගත හැකිය. ගල් කුට්ටිවල විශාලත්වය පාදම වැද්දුම් ක්‍රම මෙන්ම ඉංජිනේරුවන්ට අවශ්‍ය ආකාරයකට ගල් හසුරුවාගෙන ඇති ආකාරය පිළිබඳ සුවිශේෂී තොරතුරු ප්‍රමාණයක් ද්‍රව්‍යාත්මකව මේ තුළින් තවුරු වේ. එමෙන්ම අතීත වාරි ඉංජිනේරුවා තුළ වූ ජල කළමනාකරණය මෙහි ඉදිකිරීම් තාක්ෂණය තුළින් මැනවින් පැහැදිලි වේ. විශේෂයෙන්ම ජලය පිටතට ගලා නොයනසේ අපේක්ෂිත ගමනාන්තය දක්වා රැගෙනයාම පිළිබඳ නිශ්චිත අරමුණක් මතහිද මෙය ඉදිකරන්නට ඇතැයි තහවුරු කළ හැකිය.

ප්‍රමුඛ පද : වාරි තාක්ෂණය, ජලය, ඇළ, ගල්, නිර්මාණය

---

[1] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය. *charithabuddhik62@gmail.com*